# 2008 වසර ජන අරගලයේ වසරක් වේවි!

මේ ලබන නව වසර ජයග්‍රාහී යුධ වසරක් ලෙස යුදවාදීන් හඳුන්වනවා. මෙයින් කියන්නේ මේ ටික කලකින් ප්‍රභාකරන් ඇතුළු කොටි නායකයින් වනසා දමා හමුදා පාලනය උතුරු-නැගෙනහිර තහවුරු කරන බවයි.

## දරුණු යුද්ධයක්

ඒ සඳහා ගුවන් ප්‍රහාර මුල් කළ සටන් ව්‍යාපාරයක් දියත් කර ඇති බවක් කියැවෙනව. වන්නිය වට කර හැම පැත්තකින්ම පහර දෙමින් කොටි පාලනය සුන්නත්දූලි කිරීමට බලාපොරොත්තු වෙනව.

ඒ අතරම එය ලේසි වැඩක් නොවන බවත් පිළිගන්නව. මොකද? කොටි සංවිධානයේ සටන් ශක්තිය අවතක්සේරු කළ නොහැකි නිසා. මේ අනුව ඉතාම දරුණු ලේ වැගිරෙන අවුරුද්දක් අපට බලාපොරොත්තු වෙන්න පුළුවන්.

## උග්‍ර කම්කරු මර්ධනයක්

අනෙක් අතට අයවැය ජයග්‍රහනය සමගම දකුණට එල්ල වූ දරුණු බෝම්බයක් ලෙස සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අලුත් චක්‍රලේඛය වෘත්තීය සමිති හෙළා දක තිබෙනව. ඒ මගින් වැඩවර්ජන කරන සේවකයින්ගේ පඩි කැපීම, උසස්වීම් නැවැත්වීම, වැඩ තහනම් කිරීම ආදී නොයෙකුත් මර්ධන යොජනා වෙනවා.

වෘත්තීය සමිති නායක සමන් රත්නප්‍රිය කියන්නේ මේ යෝජනා ලෝකය පිළිගත්, එක්සත් ජාතීන්ගේ සංගමය පිළිගත්, ජාත්‍යන්තර කම්කරු සංවිධාන පිළිගත් කම්කරු අයිතීන්ට මුලුමණින්ම පටහැනි බවයි. මේ ගැන ජාතික හා ජාත්‍යන්තර උද්සෝෂණයක් ගෙන යන අතර මහා වැඩවර්ජන මාවතට යාමටත් සූදානම් බවයි.

මොකද? මේක නිකම් සෞඛ්‍ය ලේකම්ගේ මෝඩකමට ඉදිරිපත් කළ චක්‍රලේඛයක් නම් නෙවෙයි. සෞඛ්‍ය වැඩවර්ජන ගැන ජනතාව තුළ දිගටම වෛරය අවුස්සා තිබෙන නිසා එතැනින් පටන් ගෙන මුළු රාජ්‍ය අංශයටත්, අනතුරුව සංස්ථා අංශයටත් මේ බලපෑම ගෙන යෑමට සූදානම ගැන අලුතින් කැට අවශ්‍ය වෙන්නේ නෑ.

එතැනින් නොනැවතී පුද්ගලික අංශයටත් මේ වාරණය ගෙන යන්න බලාපොරොත්තු වෙනවා ඇති. විශේෂයෙන්ම දන් පුපුරණ ගිනි මැලයක් වගේ ඇති වතු අංශයට මේ තහංචි ගෙනයන්නම වෙනව.

අද වතුකරයේ සොච්චම් වැටුපෙන් ජීවිතය ගැට ගහගන්න බැරි තැනට ඇවිත් ඉවරයි. ඒ නිසා ඒ ගැන විශේෂ මර්ධන සැලැස්මක් ආණ්ඩුවට අවශ්‍ය වෙනව.

අනෙක් අතට අධ්‍යාපන අංශයේ වියදම දරා ගන්න බැරිව ආණ්ඩුව ලතැවෙනව. මේ අංශයේ ආ ගුරු සටනට ආණ්ඩුව අධිකරණයේ පිහිට පැතුවා. මේ විදියට අධිකරණයේ පිහිටෙන් සටන්වලට තහංචි දැමීම අලුතින් වර්ධනය කරගත් ආණ්ඩුවේ මර්ධන වැඩපිළිවෙලක්. එයට මුහුණ දෙන්නට සමිතිවලට අනිවාර්යයෙන්ම සිද්ධ වෙනව.

## මර්ධනය ශිෂ්‍ය ව්‍යාපාරයටත්

මේ ගැන ලාංකික ශිෂ්‍ය ව්‍යාපාරයටත් සැලකිලිමත් වෙන්නට වෙනව. පහුගිය කාලය පුරාම සිසුන්ට පොලිසිය කඳුළු ගෑස් හා බැටන් ප්‍රහාරවලින් මුහුණ දුන්නා. මෙතැනදීත් ආවරණය ලබාගත්තේ අධිකරණයෙන්. මීළඟට සිසුන්ගේ පංති තහනම් කිරීම්, දොට්ට දැමීම් වැඩි වෙන්නත් පුළුවන්. අනෙක් අතට පුද්ගලික සරසවිවලට දෙන සහන වැඩි වේවි. සෑම අංශයකම බුද්ධිමත් සිසුන්ට පුද්ගලික සරසවිවලට ශිෂ්‍යත්ව දීමේ වැඩපිළිවෙලකුත් දන් යටින් අරඹලා තියෙන්නේ.

**මහින්දගේ එජාප වැඩපිළිවෙලට නැගෙන ජනතා විරෝධය**

විවෘත ආර්ථිකය පිළිගන්නව නම් ඇයි අධ්‍යාපනයේ වෙළඳපොලට ඉඩ නොදෙන්නේ කියන තර්කය තමා දැන් මේ ආණ්ඩුවේ හිතවතුන් ඉදිරිපත් කරන්නේ.

එනිසා සෑම පැත්තෙන්ම එක්සත් ජාතික පක්ෂයේ ආර්ථික සමාජ වැඩපිළිවෙලම අකුරට දියත් කරමින් තමා මහින්ද යුදවාදී වැඩපිළිවෙල ඉදිරියට ගෙන යන්නේ. එනිසා ප්‍රතිපත්ති ගැන මූලික විරෝධතාවයක් යූඇන්පීයට නෑ. ඒ වෙනුවට කථා කරන්නේ මැර බලය, දූෂණ, වංචා ආදිය ගැන පමණයි.

හැබැයි මර්වින් සිල්වා ඇමතිගේ සිද්ධියෙන් දැන් එක දෙයක් එළදරව් වුණා. ආණ්ඩුවට ලැදි අය වැඩියෙන් ඉන්න තැනක වුණත් වෛරය පුපුරා යන්නට පුළුවන් බව. එම වෛරය පෙන්වූයේ මර්වින්ට විතරක් නෙවෙයි. ඔහු පසුපස ඉන්න ඔහුගේ ලොක්කා මහින්දටත් එම විරෝධය ගැන සලකන්න වෙනව. මොකද? කවුරුත් දන්න දෙයක් මර්වින් ඔය ඇමතිකම් ඇතුළු සියළු බලතල දරා ඉන්නේ මහින්දගේ නඩත්තුවෙන් කියලා.

අද වෙනකල් කිසිම ප්‍රශ්නයක් ඔහුට මතු වුණේ නැත්තේ ඒ නිසයි. ගෝලයට එක තැනක මුහුණ දෙන්න සිදු වූ දෙයට ලොක්කට ලංකාව පුරාම මුහුණ දෙන්න වෙයිද කියන ප්‍රශ්නය අනිවාර්යයෙන්ම මතු වෙනව.

නන්දන ගුණතිලක කියන්නේ ජනතා විමුක්ති පෙරමුණ තුළම සන්නද්ධ කැලෑ සටනට ප්‍රවනතාවයක් තිබෙන බවයි. එහෙම ඒ ප්‍රවනතාවය ගැමි ගොවි ධීවර තරුණයන් තුළ ඇති පොදු ප්‍රවනතාවයක් විය යුතුයි. මොකද? මේ සියල්ලොම එකම සමාජ කුලකයකට වැටෙන නිසා.

දැනට කැලෑවලට ගිහින් වන්නිය වට කරගෙන ඉන්න හමුදා තරුණයන් අතරටත් මෙවැනි ප්‍රවනතාවයක් යන්න ඕනෑ. මොකද? මේ සේරම එකම පවුල්වල දරුවෝ.

ආණුඩුව නම් කියන්නේ යුද්ධය ඉවර කරල දේශපාලන විසඳුමක් දෙන්න බලාපොරොත්තු වෙනව කියල. එය අනිවාර්යයෙන්ම ජනතා විමුක්ති පෙරමුණට හා හෙළ උරුමයට විරුද්ධ යෝජනාවක් විය යුතුයි. ඒ අය එකඟ වෙන්නේ විසඳුමකට නෙවෙයි මර්ධනයකට නිසා.

දැනටමත් හෙළ උරුමය ලොකු රණ්ඩුවක් අල්ලනවා තමන්ට හොරා තිස්ස වැඩ කරනවා කියලා. මේ කඹ ඇදිල්ල උඩ කොහොමටත් හැමෝම එකඟ විසඳුමකට එන්න ඉඩ ඇත්තේ ස්වල්පයක්.

අනෙක් අතට එවන් එකඟතාවයකට ඩග්ලස්, ආනන්ද සංගරී වගේ අයවත් අත්සන් තබයි කියලා හිතන්න බෑ. වැරදිලාවත් මේ ඔක්කොම නවත්වලා බලය බෙදාහැරීමක් මහින්ද රජය නිකමටවත් ඉදිරිපත් කළොත් ලොකු සිංහලේ කැරැල්ලක් ඇති වෙන්නටත් ඉඩ තියෙනව.

මේ විදියට කොයි පැත්තෙන් බැලුවත් වාර්ගික යුද්ධය සිවිල් යුද්ධයක් ලෙසට දකුණටත් පැතිරෙන්න තිබෙන ඉඩකඩ වැඩියි.

එනිසා තමා අපි කියන්නේ 2008 යුද්ධයේ වසර වගේම ජන අරගලයේ වසරක් වේවි කියල.